**රත්නපුර ප්‍රාදේශීය සභාව - 2020**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

රත්නපුර ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රත්නපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**---------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුද්දර ගාස්තු ආදායම් ගිණුමේ ඉකුත් වර්ෂවල බිල්කිරීම් වෙනුවෙන් ලැබිය යුතු එකතුව රු. 21,655,124 ක් වුවද, ඉකුත් වර්ෂ වලට අදාලව සමාලෝචිත වර්ෂය තුල ලැබීම් රු.36,102,614 ක් විය. ඒ අනුව රු. 14,447,490 ක ඌන වෙන්කිරීම් සඳහා ගැලපීම් කර නොතිබීම හේතුවෙන් සමුච්චිත අරමුදලේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. | 2020 ලැබීම් අනුව තවදුරටත් රු.14,447,490 ක මුදල සඳහා ඌන වෙන්කිරීම් සිදුකල යුතුදැයි සත්‍ය තොරතුරු අනාවරණය කර ගෙන ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | ඉකුත් වර්ෂවලට අදාලව මුද්දර ගාස්තු ආදායම් ඌන වෙන්කිරීම් සඳහා ගැලපීම් සිදුකළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 06 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 8,358,478 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන අනුව උපයෝගී ලේඛන පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා බව. | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන සසඳා පවතින වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීම් කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 489,918 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළව විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | දිගු කලක සිට පැවත එන මෙම ශේෂයන් සනාථ කර ගැනීමට ලිඛිත සාක්ෂි නොමැති බවත්, තවදුරටත් සොයාබලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ අදාළ සාක්ෂි මඟින් තහවුරු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (2) | 2012 වර්ෂයේ සිට 2017 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල එකතුව රු. 3,290,494 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාළ පාර්ශව ලිඛිතව දැනුවත් කර ඇති බවත්, දින 14 ක් ඇතුළත තැන්පතු ලබා ගැනීම නොකරන්නේ නම් අදාල මුදල් ආදායමට ගැනීමට කටයුතු කරන බව. | යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,243,694 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 24,058,791 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **වෙනත් ආදායම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂය තුල සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරු 14 ක් ගාස්තු නොගෙවීම නිසා ගලවා ඉවත් කර තිබූ අතර, ඊට අදාලව අයවිය යුතුව පැවති රු.228,900 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | මුදල් නොගෙවූ දැන්වීම් පුවරු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ ඇතුළත් විධිවිධාන අනුව කටයුතු කිරීමට සිදුවූ බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සභා බල ප්‍රදේශය තුල පවතින විදුලි සංදේශන කුළුණු 16 කින් හා කුඩා ජල විදුලි බලාගාර 09 කින් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු ව්‍යාපාර බදු රු.75,000 ක් අයකර ගෙන නොතිබුණි. | බල ප්‍රදේශයේ විදුලි සංදේශ කුළුණු වලින් සහ කුඩා ජල විදුලි බලාගාර වලින් මුදල් නොලැබීම සම්බන්ධයෙන් පසුවිපරම් කිරීම අවශ්‍ය වන බැවින් ඉදිරි කටයුතු සම්බන්ධයෙන් ගත් පියවරයන් තුලින් අදාල ප්‍රගතිය දැන්වීමට කටයුතු කරන බව. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා සැලසුම් සම්බන්ධයෙන් මහජන නියෝජිතයින් හා කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා 2020 ජනවාරි 21 සිට 23 දක්වා තෙදිනක නේවාසික වැඩමුළුවක් ත්‍රිකුණාමලය සමෘද්ධි අමාත්‍යාංශ පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වා තිබුණු අතර, ආහාර පාන, නවාතැන්, බෝට්ටු සවාරි හා ඉන්ධන සඳහා සහභාගී වූ නිලධාරීන් හතළිස් දෙනෙකු වෙනුවෙන් සභා අරමුදලින් රු. 344,200 ක් වැයකර තිබුණි. පුහුණු වැඩසටහන පවත්වා වසරක් ගෙවී තිබුණද, තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් දිගුකාලීන සැලසුම් සකස් කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | තිරසර සංවර්ධන සැළසුම්කරණය පිළිබඳව මහජනතාව තුළ යහපත් ආකල්ප ඇති කිරීමට නම් මහජන නියෝජිතයින්ට එකී සංකල්ප හා අරමුණු පිළිබඳව උනන්දුවක් ඇති කිරීම මෙම වැඩ සටහන සංවිධානය කිරීමේ මූලිකම පරමාර්ථය විය. ඉදිරියේදී සභාව විසින් ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව කසළ කළමනාකරණය පිළිබඳ සැලසුම් සකස් කිරීමේදී මෙම චාරිකාව තුළින් ලබාගත් දැනුම උපයෝගී කර ගැනීමට කටයුතු කරන බව. | අපේක්ෂිත අරමුණු ලඟා කරගත හැකි පරිදි පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම හා වියදම් දැරීම කළ යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කසළ එකතු කර තැබීම සඳහා නිවාසවලට බෙදාදීමේ අරමුණින් 2019 ඔක්තෝබර් 10 දින මිලදී ගෙන තිබුණු රු. 280,870 ක් වටිනාකමැති කසළ බඳුන් 1000 න් රු. 207,844 ක් වටිනාකමැති බඳුන් 740 ක් 2021 මැයි වනවිටත් බෙදා නොහැර සභා පරිශ්‍රයේ තබා තිබුණි. | කසළ බඳුන් බෙදාදීම මාසයක් ඇතුළත සිදු කරන මෙන් විෂයභාර නිළධාරීන්ට උපදෙස් ලබා දුන් බව. | අදාළ කසළ බඳුන් අරමුණුගත කාර්යයන් සඳහා යෙදවීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුල සමාලෝචිත වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1380 ක් පමණ බැහැර කිරීම සඳහා රු.1,845,505 ක පිරිවැයක් දරා තිබුණි, ඒ සඳහා කාර්යය මණ්ඩල සේවකයින් 03 දෙනෙකු ද වාහන සහ යන්ත්‍ර උපකරණ 01 ක් ද යොදවා තිබුණි. සභාව සතුව විධිමත් කසළ කළමනාකරණ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් දිරන කසළ එකතු කර රත්නපුර මහා නගර සභාවේ කසළ අංගනයට භාරදී තිබුණු අතර නොදිරන කසළ එකතු කිරීම නවතා තිබුණි. | දැනට සභාව සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය හා එක්ව කසළ කළමනාකරණ වැඩ සටහන් සාර්ථකව පවත්වාගෙන යනු ලබන බවත්, ජාතික ප්‍රතිපත්තිවලට අදාළ කසළ කළමනාකරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දැනුම හා පුහුණු අවශ්‍යතා සඳහාද මූල්‍ය ප්‍රතිපාදන වියදම් දරා ඇති බවත්, ඉදිරියේදී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර කඩිනමින් කාර්යය ඉටුකරන බව. | ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |